(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **43**.]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2018 ඔක්තෝබර් 25 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී.එම්. ස්වාමිනාදන් මහතා,** නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන හා උතුරු සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්‍ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ධුලිප් විජේසේකර මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු **තේනුක විදානගමගේ මහතා**

ගරු **චන්දිම වීරක්කොඩි මහතා**

ගරු **විමල් වීරවංශ මහතා**

ගරු **කුමාර වෙල්ගම මහතා**

ගරු **එස්. ශ්‍රීතරන් මහතා**

ගරු **ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

ගරු **ජයන්ත සමරවීර මහතා**

ගරු **සන්දිත් සමරසිංහ මහතා**

ගරු **රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ඊ. සරවනපවන් මහතා**

ගරු **ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

ගරු **තිලංග සුමතිපාල මහතා**

ගරු **එම්. ඒ. සුමන්තිරන් මහතා**

ගරු **මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

ගරු **චතුර සංදීප සේනාරත්න මහතා**

ගරු **ශෙහාන් සේමසිංහ මහතා**

ගරු **විජේපාල හෙට්ටිආරච්චි මහතා**

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

ගරු **කනක හේරත් මහතා**

ගරු **විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන : කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව 'ත්‍රස්තවාදය වැළැක්වීමේ' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් අටක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

II

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 ඔක්තෝබර් 22 දින 'හානිපූරණය සඳහා වන කාර්යාලය' නමැති පනත් කෙටුම්පතෙහි ම'විසින් සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම : (1) කථානායකවරයා විසින්, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 54 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 34 වගන්තිය ප්‍රකාරව, විගණන සේවා කොමිෂන් සභාව විසින් සකස් කරන ලදුව මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2019 අයවැය ඇස්තමේන්තු පිළිගන්වා, එම ඇස්තමේන්තු රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

(i) 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVII හා XXVIII සහ තෙවැනි කාණ්ඩයේ XIII කොටස;

(ii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXII හා තෙවැනි කාණ්ඩයේ X කොටස; සහ

(iii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ I කොටස

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

(3) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2018 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව පිළිගන්වා, එම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට සහ ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 1995 අංක 5 දරන වරදකරුවන් භාරදීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ඔක්තෝබර් 02 දිනැති අංක 2091/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3. කාරක සභා වාර්තා පිළිගැන්වීම : (1) තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(ii) 2014 වර්ෂය සඳහා ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2011, 2012, 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන්; සහ

(ii) සක්‍රිය වගකීම් කළමණාකරන පනත යටතේ යෝජනාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

4. මහජන පෙත්සම් පිළිගැන්වීම :

(1) (i) උකුවෙල, තවලන්කොය, අංක 149/8 දරන ස්ථානයෙහි පදිංචි ජේ. එම්. බී. පී. විජේරත්න මහතාගෙන් ලැබුණු 2018.06.28 දිනැති පෙත්සම;

(ii) මාතලේ, කළුදැවල, සුදුගඟ වත්ත, පළමු පටුමග යන ලිපිනයෙහි පදිංචි කේ. ජී. පුණ්‍යසිරි මහතාගෙන් ලැබුණු 2018.06.30 දිනැති පෙත්සම;

(iii) කිඹිස්ස, සිගිරි පාර, රණවිරු මාවත යන ලිපිනයෙහි පදිංචි එම්. ඒ. ප්‍රියංකා මල්කාන්ති මෙනෙවියගෙන් ලැබුණු 2018.07.01 දිනැති පෙත්සම; සහ

(iv) මාතලේ, පලාපත්වල, කවටයාමුණ, අංක 145 දරන ස්ථානයෙහි පදිංචි පී. එම්. එස්. ආර්. දේශප්‍රිය මහතාගෙන් ලැබුණු 2018.06.26 දිනැති පෙත්සම

ගරු රංජිත් අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) අඹේපුස්ස, කීණදෙනිය, අංක 56/3 දරන ස්ථානයෙහි පදිංචි එම්. පී. එස්. ප්‍රියංකර මහතාගෙන් ලැබුණු 2018.09.03 දිනැති පෙත්සම ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ලුණුගම්වෙහෙර, නව නගරය, අංක 38 දරන ස්ථානයෙහි පදිංචි සුදුසිංහ අබේසුන්දර මහතාගෙන් ලැබුණු 2018.09.24 දිනැති පෙත්සම ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) මහරගම, ගොඩිගමුව, යහම්පත් මාවත, අංක 21 දරන ස්ථානයෙහි පදිංචි කේ. එම්. ජී. සී. ධර්මරත්න මහත්මියගෙන් ලැබුණු 2018.09.07 දිනැති පෙත්සම ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

5. ණය සහනදායක (සංශෝධන) : අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින් පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— (81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2018 නොවැම්බර් 05 වැනි සඳුදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

6. පාර්ලිමේන්තුවේ කටයුතු : පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2018 නොවැම්බර් 07 වැනි බදාදා, 08 වැනි බ්‍රහස්පතින්දා, 09 වැනි සිකුරාදා, 10 වැනි සෙනසුරාදා, 12 වැනි සඳුදා, 13 වැනි අඟහරුවාදා සහ 14 වැනි බදාදා "විසර්ජන පනත් කෙටුම්පත (2019)" සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) : පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2019)" සලකා බැලීම සඳහා 2018 නොවැම්බර් 07 වැනි බදාදා, 08 වැනි බ්‍රහස්පතින්දා, 09 වැනි සිකුරාදා, 10 වැනි සෙනසුරාදා, 12 වැනි සඳුදා සහ 13 වැනි අඟහරුවාදා යන වෙන්කල දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 7.30 දක්වා ද විය යුතු ය:

එතකුදු වුවත්, අ.භා. 7.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) : පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2019)" සලකා බැලීම සඳහා වෙන් කළ, 2018 නොවැම්බර් 14 වැනි බදාදා පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3) : පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8 හි විධිවිධානවල සහ 2018.06.20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 7.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10. මුදල් පනත් කෙටුම්පත : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ. භා. 11.06 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු පියංකර ජයරත්න මහතා මූලාසනාරූඪ විය යුතුය"යි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 1.03 ට ගරු පියංකර ජයරත්න මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 1.41 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

"ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.06 ට ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "2. (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටසේ (සංචාරක";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 1 වැනි පිටුවේ 15 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "වෙනුවට "2018 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන්" ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 2 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"එසේම තවදුරටත්, 2019 ජනවාරි මස 1 වන";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 2 වැනි පිටුවේ 11 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(2) 2019 ජනවාරි මස 1 වන දිනයේ පටන්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 3 වැනි පිටුවේ 6 වැනි සහ 7 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ලබාගෙන ඇති මාර්ගගත සංචාරක නියෝජිතවරුන්ගෙන් එකතු කර ගනු ලැබූ බද්ද සහ 11 වන වගන්තිය යටතේ සියයට 0.5 ක අනුප්‍රමාණයකට එකතු කර ගනු ලැබූ බද්ද හැර, (1) වන උපවගන්තිය";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 3 වැනි පිටුවේ 10 වැනි සහ 11 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ලබාගෙන ඇති මාර්ගගත සංචාරක නියෝජිතවරුන්ගෙන් එකතු කර ගනු ලැබූ බද්ද සහ 11 වන වගන්තිය යටතේ සියයට 0.5 ක අනුප්‍රමාණයකට එකතු කර ගනු ලැබූ බද්ද ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තියේ සිට 10 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

11 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 5 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 6 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දින";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 6 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 6 වැනි පිටුවේ 15 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ගෙවිය යුතු දිනය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 6 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"යුතු දිනය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පෙරාතුව";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

16 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 6 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"8ආ. (1) බද්ද ගෙවිය යුතු දිනය 2019 ජනවාරි";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 7 වැනි පිටුවේ 22 වැනි පේළියේ සිට 31 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"2015 අංක 10 දරන පනතේ VII වන කොටස ඉවත් කිරීම

17. (මේ කොටසේ මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) 2015 අංක 10 දරන මුදල් පනතේ VII වන කොටස (මන්දිර බද්ද) මෙයින් ඉවත් කරනු ලැබේ.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 5 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කිරීමට,—

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

18 වැනි වගන්තිය සභා සම්මත විය.

19 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 8 වැනි පිටුවේ 11 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"19. පළමු ලියාපදිංචි කිරීමේ වර්ෂය මේ පනත යටතේ සාදනු ලබන නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි දිනයක හෝ ඉන්පසුව එළඹෙන නිශ්චිතව සඳහන් කරන ලද සෑම මෝටර් වාහනයක් මත ම ඒ නියෝග මඟින් නියම කරනු ලබන අනුප්‍රමාණ මත (මේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 8 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"20. (1) 19 වන වගන්තිය යටතේ නියම කරනු ලබන දිනයේ හෝ ඉන් ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

21 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 9 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"21. (1) 19 වන වගන්තිය යටතේ නියම කරනු ලබන දිනයට පෙර";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22 වැනි වගන්තියේ සිට 24 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

25 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 10 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"2019 ජනවාරි මස 1 වන දිනයට පෙර අවසන් වන";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 10 වැනි පිටුවේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2019 ජනවාරි මස 1 වන දින දක්වා වන කාලසීමාව සඳහා අය බද්ද එකතු කිරීම";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

26 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 11 වැනි පිටුවේ 21 වැනි සහ 22 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"26. (1) 2019 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ණයවර ලිපිය විවෘත කරනු ලැබ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් වාහනයකට අදාළව 2019 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 11 වැනි පිටුවේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"2019 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා වන අය බද්ද එකතු කිරීම";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

27 වැනි වගන්තිය සභා සම්මත විය.

28 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 12 වැනි පිටුවේ 11 වැනි පේළියේ සිට 21 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"වලංගු කිරීම.

28. මේ පනතේ මේ කොටස ප්‍රකාරව, කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් බැංකුවක් විසින් 24 වන වගන්තිය යටතේ වන අය බද්දෙහි යම් මුදල් ප්‍රමාණයක් 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී යම් මෝටර් වාහනයක් ආනයනය කරන තැනැත්තකුගෙන් එකතු කරනු ලැබ ඇති අවස්ථාවක දී සියළු කාර්යයන් සඳහා එම එකතු කිරීම වලංගු ලෙස සිදු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී එකතු කිරීමට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමෙන් බැංකුව සහ කොමසාරිස් ජනරාල්වරයා මෙයින් විනිර්මුක්ත කරනු ලැබේ.";

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

29 වැනි වගන්තිය සහ 30 වැනි වගන්තිය සභා සම්මත විය.

31 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 13 වැනි පිටුවේ 10 වැනි සහ 11 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා දෙවන උපලේඛනයේ සඳහන් එක් එක්'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 13 වැනි පිටුවේ 22 වැනි පේළියේ සිට 25 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "(2) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑම අදාළ සමාගමකින්ම 2019 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අය බද්ද එකතු කර'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

32 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 14 වැනි පිටුවේ 2 වැනි පේළියේ සිට 5 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "වුව ද, 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලබන යම් සමාගමක් අය'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

33 වැනි වගන්තිය සහ 34 වැනි වගන්ති සභා සම්මත විය.

35 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 14 වැනි පිටුවේ 29 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "වලංගු කිරීම. 35. මේ පනතේ මේ කොටස ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් 31 වන වගන්තිය යටතේ වන අය බද්දෙහි යම් මුදලක් ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව සඳහා 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කළ හෝ ලියාපදිංචි කළ යම් සමාගමකින් එකතු කරනු ලැබ ඇති අවස්ථාවක දී, සියලු

කාර්යයන් සඳහා එම එකතු කිරීම වලංගු ලෙස සිදු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී එකතු කිරීමට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා මෙයින් විනිර්මුක්ත කරනු ලැබේ.'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

36 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 15 වැනි පිටුවේ 3 වැනි සහ 4 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''36. (1) 2018 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන නමුත් 2021 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන සෑම මාසයක් සඳහා ම සෑම මූල්‍ය ආයතනයකින් ම, ඒ එක් එක්'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 15 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(2) මේ වගන්තියේ කාර්ය සඳහා සපයනු ලබන මූල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 ඇ වගන්තියේ නිශ්චිතව සඳහන් විධිවිධාන මත පදනම්ව, ගණන් බැලිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සපයනු ලබන මූල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය ගණනය කිරීම සඳහා සැළකිල්ලට ගනු ලබන මූල්‍ය ආයතනයේ මෙහෙයුම් ලාභයේ හෝ පාඩුවේ ප්‍රමාණය, මෙම වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25අ වන වගන්තිය යටතේ ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද සහ 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ (2) වන උප වගන්තියේ (iii) වන ඡේදය යටතේ ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද යන බදු අඩු කිරීමට පෙරාතුව එකී මූල්‍ය ආයතනයේ ලාභයේ හෝ පාඩුවේ ප්‍රමාණය විය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 15 වැනි පිටුවේ 16 වැනි සහ 17 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''එකතු කළ අගය මත ප්‍රකාශයක් සමඟ අදාළ මාසයෙන් පසු එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර,'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක් : 15 වැනි පිටුවේ 19 වැනි පේළියේ සිට 22 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(4) මූල්‍ය ආයතනයක් විසින්, එම මූල්‍ය ආයතනයේ එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් වාර්තාවක්, ඒ මුදල් වර්ෂයේ අවසානයේ සිට මාස හයක කාල සීමාවක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන යම් ආකෘතියකින් ඉදිරිපත් කළ යුතු ය.'';

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

37 වැනි වගන්තිය සහ 38 වැනි වගන්ති සභා සම්මත විය.

39 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 16 වැනි පිටුවේ 17 වැනි සහ 18 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "(ආ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක්,";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

40 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 16 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "40. (1) 2019 ජනවාරි මස 1 වන දින සිට සෑම";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

41 වැනි වගන්තියේ සිට 43 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

44 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 18 වැනි පිටුවේ 13 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "(3) (අ) යම් ජංගම දුරකථන ක්‍රියාකරුවකුට අයත් නොවන යම් දුරකථන කුළුණක් සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු අය බද්ද, එම දුරකථන කුළුණ භාවිත කරන ජංගම දුරකථන ක්‍රියාකරුගෙන් අය කරනු ලැබිය යුතු ය.
>
> (ආ) ජංගම දුරකථන ක්‍රියාකරුවන් එක් අයකුට වඩා දුරකථන කුළුණක් භාවිත කරන අවස්ථාවක දී, එම ජංගම දුරකථන ක්‍රියාකරුවන් විසින් එම අය බද්ද සමාන කොටස්වලින් ගෙවනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

45 වැනි සහ 46 වැනි වගන්ති සභා සම්මත විය.

47 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 19 වැනි පිටුවේ 17 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"කර ඇති දුරකථන සන්නිවේදන ස්ථානයක් අදහස්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

48 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 19 වැනි පිටුවේ 25 වැනි පේළි ය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"48(1) 2019 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

49 වැනි වගන්තියේ සිට 52 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

පළමුවැනි උපාල්ඛනය

"පළමුවැනි උපාල්ඛනය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

දෙවැනි උපාල්ඛනය

"දෙවැනි උපාල්ඛනය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තෙවැනි උපාල්ඛනය

"තෙවැනි උපාල්ඛනය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය"යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

11. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1) : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 31 දිනැති අංක 2073/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2) : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 08 දිනැති අංක 2074/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3) : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 14 දිනැති අංක 2075/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14. කල් තැබීම (ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ බන්ධනාගාරගත රැඳවියන් නිදහස් කිරීම) : ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි, පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

''ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය''යි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.57 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

''ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය යුතුය''යි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.17 ට ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 5.09 ට, 2018 ඔක්තෝබර් 26 වැනි සිකුරාදා පූ. භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.